## දැක්ම

නිවැරදි හා සාධාරණ ජයග්‍රහණයක් උදෙසා තහනම් ද්‍රව්‍යවලින් තොර ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්

## මෙහෙවර

ලෝක මත්ද්‍රව්‍ය නිවාරණ පනත සහ එහි රෙගුලාසිවලට අනුකූල වන ආකාරයට 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීම.



## සභාපතිතුමාගේ පණිවුඩය

වත්මන් සමාජීය පරිණාමයේ විශාල වැදගත්කමක් උසුලන අංශයක් ලෙස ක්‍රීඩාව දැකිය හැකි අතර පසුගිය දශක ගණනාව තුළදී සැලකිය යුතු මට්ටමකට ක්‍රීඩාවෙහි දියුණුවක් සිදු වූ බව කාටත් නොරහසකි. මනා ජවයකින් යුතුව ක්‍රීඩාවේ නියැලෙන ශ්‍රී ලාංකික ක්‍රීඩික ක්‍රීඩිකාවන් පසුගිය කාලවකවානුව තුළදී ජාත්‍යන්තර ජයග්‍රහණ රැසක් ශ්‍රී ලංකා මාතාව වෙත දායාද කර ඇති බව පෙන්වාදීම ආඩම්බරයට කරුණකි. වත්මන් රජය සමඟ සහයෝගීව කටයුතු කරමින් ක්‍රීඩා අමාත්‍යාංශය, ක්‍රීඩාවේ උන්නතිය උදෙසා ඉටු කරන සුවිශාල මෙහෙවර සුළු පටු නොවේ. වර්තමානයේ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ආරම්භ වී දැනට වසර හයකි. මෙකී සය වසරක කාලය තුළ පිරිසිදු ක්‍රීඩාවක් බිහි කිරීමෙහිලා මෙම ආයතනය විසින් සිදු කරන කාර්යභාරය නිබඳවම ඇගයීමට ලක් කළ යුතුය. ඒ අතරින් සියලු ආකාරයේ ක්‍රීඩාවල නියැලෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට උත්තේජක භාවිතයෙන් තොරව සුපිරිසිදුව ක්‍රීඩාවේ නියැලීමට අවශ්‍ය කරන සියලුම දැනුම ලබා දීම සඳහා උපදේශන මාලාවන් අවම වශයෙන් මසකට තෙවරක් හෝ පැවැත්වේ. මීට අමතරව නොයෙකුත් පර්යේෂණ සිදු කිරීම හරහා ක්‍රීඩකයන්ට අහිතකර ද්‍රව්‍ය මෙන්ම හිතකර ද්‍රව්‍ය පිළිබඳව ද අනාවරණය කරයි. 2020 වර්ෂය තුළදී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි පර්යේෂණාගාරය විවෘත කිරීමට නියමිත බැවින් ඒ හරහා පෙර වසරවලට සාපේක්ෂව පර්යේෂණ මට්ටමින් විශාල අභිවෘද්ධියක් ලැබිය හැකි බව මාගේ විශ්වාසය යි. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මුඛ්‍ය අරමුණ වන, ක්‍රීඩාවේදී භාවිත නොකළ යුතු යැයි නියම වූ තහනම් ද්‍රව්‍ය හා ක්‍රම මුලිනුපුටා දැමීම තේමා කොට ගෙන සුපුරුදු ලෙස 2019 වසර පුරාම ක්‍රමවත් වූත් අර්ථාන්විත වූත් ගමනක යෙදුණි. එමෙන්ම 2020 වසරේදී සිදු කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් කිහිපයක්ම දැනටම සැලසුම් කර ඇත. 2018 වසරේදී ආරම්භ කළ රුධිර සාම්පල ලබා ගැනීම තුළින් තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම මෙම වසරේදී ද සාර්ථක ලෙස සිදුකරගෙන යාමට හැකි වීම සතුටට කරුණකි. තවද මීට අමතරව සිලෝන් බිස්කට් සමාගම මෙන්ම ඕස්ට්‍රේලියානු උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (ASADA) සමඟ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය එළඹ ඇති අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව ක්‍රීඩකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් කීපයක්ම ලබන වසරේදී සිදු කිරීම අපගේ තවත් එක් විශාල අභිප්‍රායක් වේ. ඊට අමතරව 2019 වසරේ ඕස්ට්‍රේලියානු උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ බුද්ධි අංශ නිලධාරියෙකු පැමිණ අප ආයතනයේ නිලධාරී මණ්ඩලය සඳහා, විමර්ශන සිදු කිරීම පිළිබඳව දැනුවත් කිරීමක්, පාර්ශවයන් අතර ඇති අවබෝධතා ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස සිදු කෙරිණි. 2020 වසර තුළදී ද සිදු කිරීමට බලාපොරොත්තු වන අනාගත සැලසුම් විශාල ප්‍රමාණයක් පවතින අතර එකී සියලු බලාපොරොත්තු සාක්ෂාත් කර ගනිමින් ශ්‍රී ලාංකීය අව්‍යාජ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ඉදිරි වසරේදී ද ප්‍රශස්ත සේවයක් ශ්‍රී ලංකාවාසී ජනතාව වෙනුවෙන් සිදු කිරීමට ලැබේවායි සුභාශිංෂණය කරමි.

**මහාචාර්ය අර්ජුන ද සිල්වා**
සභාපති



## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

ජයග්‍රහණය හා පරාජය යනු ක්‍රීඩාව හා බැඳී පවතින අන්‍යෝන්‍ය සංකල්ප දෙකකි. එය එකම කාසියක දෙපැත්ත බඳු වන අතර අතීතයේ සිටම ක්‍රීඩකයාගේ එකම අපේක්ෂාව හා අරමුණ වූයේද "ජයග්‍රහණය" යන අවස්ථාව අත්පත් කර ගැනීමයි.

වර්තමානයේ බොහෝ විට අප අත්දකින්නේ වාණිජමය ස්වරූපයන් අත්කරගත් ක්‍රීඩා ක්ෂේත්‍රයකි. ක්‍රීඩාව වෙත යොමු වන ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව හුදෙක් ජයග්‍රහණය පිණිසම සිය කාර්ය සාධනය විදහාලීමට බලපා ඇත්තේ ද මෙම වාණිජමය ස්වරූපය නිසාවෙනි. මෙහිදී තහනම් ද්‍රව්‍ය හා ක්‍රම හුදු ජයග්‍රහණය පිණිසම කරලියට පැමිණේ.

එම තත්ත්වය වැළැක්වීමටත් අව්‍යාජ ක්‍රීඩකයා ආරක්ෂා කිරීමටත් 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය බිහිවිය.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය බිහිවී සිය සය වන වසර ලෙස 2019 වර්ෂය සාර්ථකව සිය කටයුතු දියත් කරන ලදී. මෙම 2019 වර්ෂය තුළ කැපී පෙනෙන සංධිස්ථාන කිහිපයක් සනිටුහන් විය. ඒ අතර ආයතනය වෙනුවෙන් ඉදිවූ නව ගොඩනැගිලි පරිශ්‍රය 2019 / 02 / 28 දින උත්කර්ෂවත් අන්දමින් ජනතා අයිතියට පත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුන්ගේ සුරතින් අප නව කාර්යාල පරිශ්‍රය විවෘත කිරීම සිදු කරනු ලැබීය. මේ සඳහා එවකට විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍ය ගරු හරීන් ප්‍රනාන්දු මහතා, අමාත්‍යාංශ උසස් නිලධාරීන් ඇතුලු සම්භාවණීය ආරාධිතයන් රැසක් මෙම අභිනව කටයුත්ත සඳහා සහභාගි වුණි.

මෙම ගොඩනැගිලි පරිශ්‍රය තුළ රසායනාගාර පර්යේෂණ ඒකකයක් ද පවතී. එහි ඉදිකිරීමේ කටයුතු 2019 වසර පුරා දියත් කරනු ලැබිණි. මේ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද හිමිවුණි. මෙම පර්යේෂණාගාරය සියලු අංගයන්ගෙන් සමන්විත නව පර්යේෂණාගාරයකි. 2019 වසර පුරා මෙම ඒකකයේ ඉදිකිරීම් සිදු වූ අතර ඒ සඳහා Liquid Chromatography Tandem Mass Spectrometer (LCMS) යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට ද කටයුතු සිදු කෙරිණි. එමගින් ජාත්‍යන්තර මට්ටමේ රසායනාගාර පර්යේෂණ සිදු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සුපුරුදු කාර්යයන් වන තහනම් උත්තේජක පරීක්ෂණ හා දැනුවත් කිරීම්ද 2019 වසර පුරා සාර්ථකව දියත් කෙරිණි. ඒ අනුව 2019 වසර තුළ තහනම් උත්තේජක පරීක්ෂණ 260ක් (මුත්‍රා) හා රුධිර පරීක්ෂණ 20ක් සිදු කළහ. තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතය වැළැක්වීම හා අව්‍යාජ ක්‍රීඩාවේ අභිවෘද්ධිය පිණිස ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දෙමව්පියන් හා ක්‍රීඩාව හා බැඳි 3823 ක පිරිසක් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී විශේෂත්වය වනුයේ 2019 වසරේ නේපාලයේ පැවති දකුණු ආසියාතික ක්‍රීඩා තරඟ නියෝජනය කළ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් සියලු දෙනා තහනම් උත්තේජක පරීක්ෂණවලට යොමු කළ අතර තහනම් උත්තේජක වැළැක්වීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම් ද ඔවුන් හට සිදුකළහ. මෙම තරඟාවලියේදී ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් සිය මව් රට වෙනුවෙන් අභිමානවත් ජයග්‍රහණ රැසක් අත්කර දීමට හැකියාව ලැබිණි.

මේ වෙනුවෙන් යුධ, නාවික හා ගුවන් හමුදාවේ සහයෝගය ලබා ගැනීමට හැකි වීම එහි සාර්ථකත්වය කෙරෙහි ධනාත්මකව බලපෑ බව කියනුයේ මහත්වූ අභිමානයෙනි. ඉදිරි පරිච්ඡේදයන් හීදී ශ්‍රී ලංකා යුධ, නාවික හා ගුවන් හමුදාවේ සහ ජාතික තරුණ සේවා සභාවේ දායකත්වයන්ගෙන් මෙම කටයුතු සිදු කිරීමට අප බලාපොරොත්තු වේ. 2020 වසරේ ප්‍රධාන ඉලක්කයන් ලෙස පර්යේෂණාගාරය විවෘත කිරීමට කටයුතු යොදා තිබේ. එමගින් දේශීය ආයුර්වේද ඖෂධ හා ආහාරයන්හි තහනම් ද්‍රව්‍ය සංඝටක අන්තර්ගතය පිළිබඳ සොයා බැලීමටත් එම දැනුම ජාත්‍යන්තරයට හුවමාරු කරලීමටත් හැකිවනු ඇත. එලෙසට තහනම් උත්තේජක පරීක්ෂණ හා දැනුවත් කිරීම් සුපුරුදු ලෙස 2020 වසරේදි තීව්‍ර කිරීමට අප බලාපොරොත්තු වේ.

මෙම සෑම අංශයකම ප්‍රගතිය තුළින් වඩා තිරසර හා ප්‍රශස්ථ මට්ටමේ අව්‍යාජ ක්‍රීඩාවක් හා ක්‍රීඩා සංස්කෘතියක් බිහිවනු දැකීම අප කාගේත් අපේක්ෂාවයි. 2019 වසරේදී අප ආයතනය ලද මෙම සාර්ථකත්වය සඳහා සහය දුන් සියලුම පාර්ශවයන්ට මාගේ හද පිරි ස්තුතිය පිරිනමන අතර තහනම් ද්‍රව්‍ය හා ක්‍රමවලින් තොර අව්‍යාජ ක්‍රීඩා සංස්කෘතියක් බිහිකරලීමට දරණ මෙම ප්‍රයත්නය සඵල වේවා යැයි සුභ පතමි.

**වෛද්‍ය සීවලි ජයවික්‍රම**
අධ්‍යක්ෂ ජනරාල්

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වත්මන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ස්ථානය හිමි වූයේ සහජ හැකියාවෙන් පිරිපුන් පිරිසිදු ක්‍රීඩාවක් සඳහාය. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ පවතින තහනම් උත්තේජක භාවිතය පිටුදැකීම හා ඒ පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධයෙන් පවතින එකම හා ප්‍රධානතම ආයතනය වනුයේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයයි.

2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ තුන්වන කොටස යටතේ මෙම ආයතනය පිහිටුවා ඇත. දැනට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ ක්‍රීඩික ක්‍රීඩිකාවන් ක්‍රීඩාවේදී භාවිතා නොකළ යුතු තහනම් උත්තේජක මුලිනුපුටා දැමීම හා යහපත් පිරිසිදු භාවයෙන් යුතු ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීමයි. අප ආයතනය මේ හා සම්බන්ධව කටයුතු කරන ශ්‍රී ලංකාවේ එකම ආයතනය වේ. අන්තර්ජාතික ක්‍රීඩාවේදී තහනම් උත්තේජක ද්‍රව්‍ය පිටුදැකීම වෙනුවෙන් කටයුතු කරන ජාත්‍යන්තර ආයතන සමඟ ද එක්ව සහයෝගීව කටයුතු කරයි.

## අරමුණු

පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව නියෝජ්‍යායතනයේ පරමාර්ථ විය යුත්තේ:-

(අ) ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීම.

(ආ) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම පිළිබඳ ක්ෂේත්‍ර හා අදාළ පර්යේෂණ හා නියෝජ්‍යායතනය හා සමාන කර්තව්‍ය ඉටුකරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යෝන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සිය අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් සේවාවන් සැපයීම සිදුකරනු ලබයි.

01. ජාතික, අන්තර්ජාතික හා පාසල් මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උත්තේජක පරීක්ෂණ සිදුකිරීම.

02. තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතා කර ඇති බවට සනාථ වූ ක්‍රීඩකයින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම.

03. තහනම් ද්‍රව්‍ය භාවිතය හා එහි අනිටු විපාක පිළිබඳ ක්‍රීඩකයින්, පුහුණුකරුවන්, පාසල් සිසුන්, දෙමාපියන් හා අනෙකුත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් දැනුවත් කිරීම.

04. යුනෙස්කෝ ආයතනයේ අරමුදල් සහිතව ක්‍රීඩාවේදී භාවිතා වන තහනම් ද්‍රව්‍ය, තහනම් ක්‍රම, එහි අනිටු විපාක හා තහනම් ද්‍රව්‍ය පරීක්ෂණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමින් සිදු කිරීම.

05. ක්‍රීඩාවේ යෙදීමේදී තහනම් ද්‍රව්‍ය භාවිතය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා විෂය මාලාවට මෙම අංගය එක් කිරීමට කටයුතු සම්පාදනය කිරීම.

# අධ්‍යක්ෂ මණ්ඩලය



මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති



සජිත් ජයලාල් මහතා
සාමාජික



මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු
සාමාජික



මහාචාර්ය ලාල් ජයකොඩි
සාමාජික



ඩී.මුතුගල මහතා
සාමාජික



වෛද්‍ය අන්වර් හම්ඩානි
සාමාජික



එස්.අයි.එම්.රෝසා මහතා
සාමාජික



කේ.පී.සිරිබද්දන මහතා
සාමාජික



චාමර හේරත් මහතා
සාමාජික



වෛද්‍ය ඊ.ඒ.එල්.සී.කේ.
එදිරිසිංහ
සාමාජික

# වත්මන් කාර්යය මණ්ඩලය



වෛද්‍ය සීවලී ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්



එච්.එම්.සී.ජී.දයාරත්න
ගණකාධිකාරී



ජේ.එම්.ජේ.ජේ.ජයසුන්දර
අධ්‍යක්ෂ මාණ්ඩලික ලේකම්
හා නීති නිලධාරී



ඒ.එස්.ඩී.පිගේරා
පර්යේෂණ නිලධාරී



පී.එන්.ජේ.ප්‍රනාන්දු
පර්යේෂණ නිලධාරී



එස්.ඒ.එන්.රෂානි
පර්යේෂණ නිලධාරී



ජී.එන්.එස්.ප්‍රනාන්දු
පරිපාලන නිලධාරී



වයි.ඒ.යූ.මේධාවී
තොරතුරු තාක්ෂණ නිලධාරී



කේ.ආර්.කණගසභාපති
භාෂා පරිවර්තක



ඩී.කේ.ජේ.චතුරිකා
සංවර්ධන නිලධාරී



පී.ජී.එම්.අයි.අරුණ කුමාර
සංවර්ධන නිලධාරී



එස්.සූරියරාණි
සංවර්ධන නිලධාරී



එම්.ජී.ටී.ඩී.සේනාරත්න
කළමනාකරණ සහකාර



එම්.ජී.එස්.අයි.කරුණාතිලක
කළමනාකරණ සහකාර



එන්.ජී.එස්.එච්.විජේරත්න
කළමනාකරණ සහකාර



ඒ.ජී.පී.ඩී.තිලකරත්න
කාර්යාල සහයක



ඒ.ජී.එල්.කේ.එස්.ගුණවර්ධන
කාර්යාල සහයක



එම්.ඩී.ආර්.ඩී.ජයවීර
කාර්යාල සහයක



ඒ.අයි.ආර්.සේනාරත්න
රියදුරු



කේ.එම්.එල්.වැවේතැන්න
රියදුරු



කේ.පී.සී.ප්‍රේමරත්න
රියදුරු

# සංවිධාන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ
කළමනාකරණ සහකාර
පර්යේෂණ නිලධාරි
ගණකාධිකාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සහකාර
තොරතුරු තාක්ෂණ නිලධාරි
සංවර්ධන නිලධාරි
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරි (02)
තාක්ෂණ සහකාර (01)
කළමනාකරණ සහකාර (02)
රියදුරු (04)
කාර්යාල සහායක (03)
නීති නිලධාරි/මාණ්ඩලික ලේකම්
අධ්‍යක්ෂ(ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම)
සහකාර අධ්‍යක්ෂ

# 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත 28 දෙනෙකුගෙන් කාර්‍යමණ්ඩලයක් අනුමත කර දී තිබේ.

| | තනතුරු නාමය | වැටුප් තලය | තනතුරු සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | HM 2-1 | 1 | 1 | |
| 2. | අධ්‍යක්ෂ | HM 1-1 | 2 | | 2 |
| 3. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ | MM 1-1 | 2 | | 2 |
| 4. | ගණකාධිකාරි | MM 1-1 | 1 | 1 | |
| 5. | නීති නිලධාරි/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | MM 1-1 | 1 | 1 | |
| 6. | පරිපාලන නිලධාරි | JM 1-1 | 1 | 1 | |
| 7. | පර්යේෂණ නිලධාරි | AR 1 | 3 | 3 | |
| 8. | භාෂා පරිවර්තක | MA-4 | 1 | 1 | |
| 9. | තොරතුරු තාක්ෂණ නිලධාරි | JM 1-1 | 1 | 1 | |
| 10. | සංවර්ධන නිලධාරි | MA 3 | 3 | 3 | |
| 11. | කළමණාකරණ සහකාර | MA 1-1 | 4 | 3 | 1 |
| 12. | තාක්ෂණ සහකාර | MA 2-1 | 1 | | 1 |
| 13. | රියදුරු | PL 3 | 4 | 3 | 1 |
| 14. | කාර්යාල සහයක | PL 1 | 3 | 3 | |
| | එකතුව | | 28 | 21 | 7 |

# පර්යේෂණ අංශය

1. 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නව පර්යේෂණ දෙකක් සැලසුම් කරන ලදී.

ශ්‍රී ලාංකීය ක්‍රීඩික ක්‍රීඩිකාවන්ගේ ආහාරමය අතිරේක භාවිතය නිසා ඇතිවන සෞඛ්‍ය ගැටළු පිළිබඳ අධ්‍යයනය - මෙම පර්යේෂණය සඳහා කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පිහිටි "Ethics Review Committee" මගින් පර්යේෂණය පැවැත්වීමට අවශ්‍ය ethics ලබාගන්නා ලදී. මෙම පර්යේෂණයට ක්‍රීඩික ක්‍රීඩිකාවන් බඳවා ගැනීම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණයක් පවත්වන ලදී. ඊට ක්‍රීඩක ක්‍රීඩිකාවන් 98 ක් සහභාගි කරවාගන්නා ලදී. ඔවුන් වුෂු, රගර්, කබඩි ක්‍රීඩාවන්වලට පිහිටවූ ජාතික සංචිතවල ක්‍රීඩක ක්‍රීඩිකාවන්, ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ පුහුණුව ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා විශ්ව විද්‍යාල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් සමන්විතය. මෙම 98 දෙනා අතරින් සෞඛ්‍ය තත්ත්වය සොයා බැලීමේ විද්‍යාගාර පර්යේෂණ සඳහා 45 දෙනෙකු තෝරාගන්නා ලදී. නාරාහේන්පිට පිහිටි ලංකා රෝහලට අයත් විද්‍යාගාරයේදී ඔවුන්ගේ රුධිරගත සීනි පරීක්ෂණය, රුධිරගත මේද පරීක්ෂණය, වකුගඩු ක්‍රියාකාරීත්ව පරීක්ෂණය, අක්මා ක්‍රියාකාරීත්ව පරීක්ෂණය, සම්පූර්ණ රුධිර පරීක්ෂණය, සම්පූර්ණ මුත්‍රා පරීක්ෂණය, මුත්‍රාවල ප්‍රෝටීන/ක්‍රියැටීන් අනුපාත පරීක්ෂණය, රුධිරගත ටෙස්ටොස්ටෙරෝන් පරීක්ෂාව සිදුකරන ලද අතර වෛද්‍යවරයෙකු ලවා ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ද පරීක්ෂා කරන ලදී. මෙම පියවර දෙකෙහිදී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් එක් රැස්කරගත් දත්ත SPSS යන සංඛ්‍යාන විද්‍යාත්මක පරිගණක මෘදුකාංගයට ඇතුළත් කරන ලදී. එම මෘදුකාංගය උපයෝගී කොට දත්ත විශ්ලේෂණය කරමින් එම පර්යේෂණයේ සාරාංශ වාර්තාව (Abstract) සකස් කරමින් පවතී.

- ක්‍රීඩාවේ මුත්‍රා භාවිතා කර සිදු කරන තහනම් උත්තේජක පරීක්ෂණවලට ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ඇති වන බලපෑම - මෙම පර්යේෂණයේ ආරම්භක පර්යේෂණ සාහිත්‍ය අධ්‍යයනය කිරීම සිදු කල අතර එයට අදාළ මූලික අධ්‍යයනයන් ද සිදු කරන ලදී. මෙම පර්යේෂණය සඳහා ethics ලබා ගැනීමට කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පිහිටි Ethics Review Committee වෙත භාර දී ඇත. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තුළ පිහිටුවාගෙන යන පර්යේෂණාගාරය සඳහා LC-MS / MS උපකරණය මිලදී ගත් පසු මෙම පර්යේෂණයේ ඉදිරි පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට නියමිතය.

2. LC-MS / MS විද්‍යාගාර උපකරණ, ඊට අදාළ දත්ත ගබඩා, විශ්ලේෂණ ක්‍රම, නයිට්‍රජන්, උත්පාදකය, සම්මත රසායනික සංයෝග හා අනෙකුත් රසායන ද්‍රව්‍යවල නයිට්‍රජන් වායුව භාවිතා කර වියළීම් කරන උපකරණය, ගැනීමට අදාළ ටෙන්ඩර් සඳහා තාක්ෂණික ලිපි (Technical Specification) සැකසීම සිදු කරන ලදී. එම භාණ්ඩ මිලදී ගැනීමට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුවට සහය දැක්වීම.

3. පර්යේෂණාගාරයට Analytical balances" Top Loading Balance" Ultra-Pure Water Purification plant" Water Distillation Unit" Universal Centrifuge machine" Micro Centrifuge machine Ultra Sonic bath" Water Baths" Vortex Mixer" Laboratory refrigerator" Biomedical freezer" Laboratory Shaker" Heating Mantel" Magnetic Stirrer" Autoclave" Drying Cabinet" Conductivity Meter" pH Meters" Steam Bath" TDS Meter" Micro Pipettes උපකරණ ලබා ගැනීමට අදාළ ටෙන්ඩර් සඳහා තාක්ෂණික ලිපි (Technical Specification) පිළියෙල කර තාක්ෂණික ඇගයීම් කමිටුවට සහය වීමෙන් ඒවා මිල දී ගැනීමට කටයුතු කිරීම .

4. "ක්‍රීඩාවේ හැකියාව වැඩි කිරීමට ගන්නා ද්‍රව්‍යවල අරිෂ්ඨ අඩංගු වන බව සොයා බැලීම හා අරිෂ්ඨවල අඩංගු එතනෝල් ප්‍රමාණය නිර්ණය කිරීම" යන පර්යේෂණයට අදාළ සම්පූර්ණ පර්යේෂණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම සඳහා Ceylon Medical Journal වෙත භාර දීම.

5. "ශ්‍රී ලාංකික ක්‍රීඩික ක්‍රීඩිකාවන් විසින් ආහාරමය අතිරේක භාවිතා කරන ආකාරය ඒ පිළිබඳ දැනුම හා පුරුදු සෙවීමේ හරස්කඩ අධ්‍යයනය" යන පර්යේෂණයට අදාළ සම්පූර්ණ පර්යේෂණ වාර්තාව පිළියෙල කරමින් පවතී.

## තහනම් උත්තේජක පරීක්ෂණ

| අංක | විස්තරය | ජනවාරි | | පෙබරවාරි | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය |
| 1. | මූත්‍රා පරීක්ෂණ - මානව | 2 | 2 | 25 | 25 |
| | තරඟාවලිය තුල දී සංඛ්‍යාව | | | 25 | 25 |
| | තරඟාවලියෙන් පිටත දී සංඛ්‍යාව | 2 | 2 | | |
| | ESA/GHRF/IRMS මූත්‍රාපරීක්ෂණ සංඛ්‍යාව | 1 | ESA 1 | | |
| 2. | රුධිර පරීක්ෂණ - මානව | | | | |
| 3. | මූත්‍රා පරීක්ෂණ - සත්ත්ව (අශ්ව) | | | | |
| අංක | විස්තරය | මාර්තු | | අප්‍රේල් | |
| | | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය |
| 1. | මූත්‍රා පරීක්ෂණ - මානව | 33 | 33 | 17 | 17 |
| | තරඟාවලිය තුල දී සංඛ්‍යාව | 33 | 33 | 17 | 17 |
| | තරඟාවලියෙන් පිටත දී සංඛ්‍යාව | | | | |
| | ESA/GHRF/IRMS මූත්‍රා පරීක්ෂණ සංඛ්‍යාව | 5 | ESA 2<br>GHRF 1<br>Steroid pro-file 2 | | |
| 2. | රුධිර පරීක්ෂණ - මානව | | | | |
| 3. | මූත්‍රා පරීක්ෂණ - සත්ත්ව (අශ්ව) | 2 | 2 | | |
| අංක | විස්තරය | මැයි | | ජුනි | |
| | | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය |
| 1. | මූත්‍රා පරීක්ෂණ - මානව | 35 | 30 | 20 | 19 |
| | තරඟාවලිය තුල දී සංඛ්‍යාව | 20 | 21 | 12 | 4 |
| | තරඟාවලියෙන් පිටත දී සංඛ්‍යාව | 15 | 9 | 8 | 15 |
| | ESA/GHRF/IRMS මූත්‍රා පරීක්ෂණ සංඛ්‍යාව | | | 3 | |
| 2. | රුධිර පරීක්ෂණ - මානව | 6 | 2 | 6 | 7 |
| 3. | මූත්‍රා පරීක්ෂණ - සත්ත්ව (අශ්ව) | | | | |

| අංක | විස්තරය | ජූලි | | අගෝස්තු | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය |
| 1. | මූත්‍රා පරීක්ෂණ - මානව | 30 | 6 | 5 | 55 |
| | තරඟාවලිය තුල දී සංඛ්‍යාව | 20 | 6 | 3 | 52 |
| | තරඟාවලියෙන් පිටත දී සංඛ්‍යාව | 10 | | 2 | 3 |
| | ESA/GHRF/IRMS මූත්‍රා පරීක්ෂණ සංඛ්‍යාව | 3 | | 1 | ESA 2 GHRF 6 |
| 2. | රුධිර පරීක්ෂණ - මානව | 6 | | 6 | 2 |
| 3. | මූත්‍රා පරීක්ෂණ - සත්ත්ව (අශ්ව) | | | | |
| අංක | විස්තරය | සැප්තැම්බර් | | ඔක්තෝම්බර් | |
| | | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය |
| 1. | මූත්‍රා පරීක්ෂණ - මානව | 30 | 5 | 30 | 59 |
| | තරඟාවලිය තුල දී සංඛ්‍යාව | 20 | 5 | 20 | 59 |
| | තරඟාවලියෙන් පිටත දී සංඛ්‍යාව | 10 | | 10 | |
| | ESA/GHRF/IRMS මූත්‍රා පරීක්ෂණ සංඛ්‍යාව | 2 | **Steroid profile** 1 | 2 | |
| 2. | රුධිර පරීක්ෂණ - මානව | 1 | 9 | | |
| 3. | මූත්‍රා පරීක්ෂණ - සත්ත්ව (අශ්ව) | | | | |
| අංක | විස්තරය | නොවැම්බර් | | දෙසැම්බර් | |
| | | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය | ඉලක්කගත සංඛ්‍යාව | ප්‍රගතිය |
| 1. | මූත්‍රා පරීක්ෂණ - මානව | 5 | 9 | 5 | - |
| | තරඟාවලිය තුල දී සංඛ්‍යාව | 3 | 8 | 3 | - |
| | තරඟාවලියෙන් පිටත දී සංඛ්‍යාව | 2 | 1 | 2 | - |
| | ESA/GHRF/IRMS මූත්‍රා පරීක්ෂණ සංඛ්‍යාව | 1 | | 1 | - |
| 2. | රුධිර පරීක්ෂණ - මානව | | | | |
| 3. | මූත්‍රා පරීක්ෂණ - සත්ත්ව (අශ්ව) | | | | |

## මානව පරීක්ෂණ පිළිබඳ සාරාංශය 2019

## මූත්‍රා

| අංකය | ක්‍රීඩාව | උත්තේජක පරීක්ෂණ සංඛ්‍යාව | උත්තේජක භාවිතය සනාථ වූ අවස්ථා |
|---|---|---|---|
| 1. | රගර් | 19 | 1 |
| 2. | මලල ක්‍රීඩා | 120 | 2 |
| 3. | පාපැදි | 19 | 2 |
| 4. | බර ඉසිලීම | 24 | - |
| 5. | වොලිබෝල් | 4 | - |
| 6. | බොක්සිං | 4 | - |
| 7. | ක්‍රිකට් | 16 | - |
| 8. | පිහිනුම් තරඟ | 13 | - |
| 9. | මල්ලව පොර | 9 | 1 |
| 10. | කාය වර්ධන | 3 | - |
| 11. | සවි එසවීම | 2 | - |
| 12. | ජූඩෝ | 7 | - |
| 13. | පාපන්දු | 7 | - |
| 14. | කබඩි | 5 | - |
| 15. | කඹ ඇදීම | 4 | - |
| 16. | දැල් පන්දු | 3 | - |
| 17. | පැසි පන්දු | 1 | - |
| | එකතුව | 260 | 6 |

## මානව පරීක්ෂණ සාරාංශය 2019

## රුධිර

| අංකය | ක්‍රීඩාව | උත්තේජක පරීක්ෂණ සංඛ්‍යාව | උත්තේජක භාවිතය සනාථ වූ අවස්ථා |
|---|---|---|---|
| 1. | මලල ක්‍රීඩා | 5 | - |
| 2. | කබඩි | 4 | - |
| 3. | මල්ලවපොර | 3 | - |
| 4. | රගර් | 2 | - |
| 5. | Water polo | 1 | - |
| 6. | පිහිනුම් | 2 | - |
| 7. | කරාටේ | 1 | - |
| 8. | වූෂු | 2 | - |
| | එකතුව | 20 | 0 |

පරීක්ෂණ සංඛ්‍යාවඃ	මූත්‍රා පරීක්ෂණ - 260

රුධිර පරීක්ෂණ - 020

සත්ත්ව පරීක්ෂණ (අශ්ව) - 002

## දැනුවත් කිරීමේ වැඩසටහන්

| මාසය | දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීත්වය |
|---|---|---|
| ජනවාරි | 11 | 424 |
| පෙබරවාරි | 02 | 105 |
| මාර්තු | 03 | 615 |
| අප්‍රේල් | - | - |
| මැයි | 05 | 156 |
| ජූනි | 04 | 127 |
| ජූලි | 04 | 297 |
| අගෝස්තු | 05 | 574 |
| සැප්තැම්බර් | 04 | 598 |
| ඔක්තෝබර් | 03 | 84 |
| නොවැම්බර් | 09 | 766 |
| දෙසැම්බර් | 04 | 77 |
| එකතුව | 54 | 3823 |


Awareness Program for coaches (Badulla)


Youth Expo exhibition at BMICH


Awareness Program for Army Athletics Association (Badulla)


Awareness Program for coaches

"Outreach" වැඩසටහන

| දිනය | ස්ථානය | විස්තරය |
|---|---|---|
| 2019/02/23,24 | BMICH හි දී පවත්වන ලද ප්‍රදර්ශනය | "Momentum", Youth Expo 2019 |
| 2019/08/22 | සුගතදාස ක්‍රීඩාංගනය | පිහිනුම් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා |
| 2019/11/29 | සුගතදාස ක්‍රීඩාංගනය | ජෝන් ටාර්බට් තරඟාවලියේදී දෙමව්පියන් දැනුවත් කිරීම. |

## තොරතුරු තාක්ෂණ අංශය

**වෙබ් අඩවිය ප්‍රති නිර්මාණය කිරීම හා එය ක්‍රියාත්මක කිරීම.**

හේතුන් - නිර්මාණයේ යල් පැනගිය පෙනුම හා ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම. මෙම නව නිර්මාණය උත්තේජක මර්දනය පිළිබඳ පුළුල් විස්තරයක් ලබා දෙන අතර වැඩි ක්‍රියාකාරීත්වයකින් යුතු වේ.

- "TOP TIPS" නැමැති උත්තේජක මර්දනය පිළිබඳ සමාජ ජාලය හරහා සිදු කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් (facebook -Antidoping Srilanka" Twitter -@SLAntiDoping)

DR App (Drug Reference App)

ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) විසින් නිකුත් කරනු ලබන තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව සමග සසදා ලංකාවේ මිලදී ගත හැකි ඖෂධවල තහනම් තත්ත්වය පරීක්ෂා කිරීමට මෙම යෙදුම (App) ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට උපකාරී වේ.

ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තහනම් ද්‍රව්‍ය ලැයිස්තුවක් නිකුත් කරනු ලබන අතර (තහනම් ද්‍රව්‍ය හා ක්‍රම අඩංගු ලැයිස්තුවක්) එම ලැයිස්තුවේ තරඟාවලිය තුලදී හා ඉන් පිටතදී තහනම් කර ඇති ද්‍රව්‍ය හා ක්‍රම සඳහන් වේ.

මෙම යෙදුම (App) ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා වෛද්‍යවරුන් හට ඖෂධවල තහනම් තත්ත්වය පිළිබඳ අඛණ්ඩව අධීක්ෂණය කිරීමට උපකාරී වේ. App එකේ ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම සඳහා වීඩියෝ පටයක් නිර්මාණය කර ඇති අතර Web Help එකක් ද සකසා ඇත.

DR app එක 2019 ජූලි මස 30 වන දින එළිදැක්විය.

මාධ්‍ය හරහා DR app හි ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම

අපගේ නව නිර්මාණය වන මෙම App එක පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2019.09.04 වන දින Rise and Shine වැඩසටහනට තොරතුරු තාක්ෂණ නිලධාරිණී Y.A.U මේධාවී මහත්මිය සහභාගී විය.

මේ පිළිබඳ දැනුවත් කිරීමට අපගේ උපරිම දායකත්වය ලබා දෙන්නෙමු. එමගින් අපගේ අරමුණ වන්නේ සියළුම ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොදැනුවත්භාවය හේතුවෙන් තහනම් ද්‍රව්‍ය භාවිතා කිරීමේ වරදට හසුවීමේ ප්‍රවණතාවය අවම කිරීමයි.

DR app භාවිතා කිරීම සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දී ඇති පුහුණුව

ජාතික දැල්පන්දු සංචිතය

1. දකුණු ආසියාතික තරඟාවලිය සඳහා සහභාගී වන ජාතික කබඩි හා Beach වොලිබෝල් සංචිතය
2. Beach වොලිබෝල් ජාතික සංචිතය
3. ආසියාතික තරඟාවලිය සඳහා සහභාගී වන ත්‍රිවිධ හමුදා මලල ක්‍රීඩා සංචිතය
4. ක්‍රීඩා ශක්ති වැඩසටහන
5. ශ්‍රී ලංකා හමුදා මලල ක්‍රීඩා සංචිතය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නිල වෙබ් අඩවිය (https://slantidoping.org/) භාෂා 03 කින් නිර්මාණය කර ඇත. වෙබ් අඩවියේ සැලසුම් කිරීමේ හා සැකසුම් කටයුතු අප ආයතනය මඟින් සිදු කරනු ලැබීය.

එහි පහත සඳහන් පහසුකම් අඩංගු වේ:

- Custom interface, including layout, colors, fonts
- Website architecture & NAV
- Webpage template design with common theme
- Logo display in every page
- Test site
- Database

- Mobile friendly pages, tables, forms and images etc
- Sitelock security
- SSL
- Homepage with the SLADA highlights, data should retrieve from the database and quick
- links to most important resources
- Integrate with social media
- Main Slider (2 or 3 images) for home page and sub sliders (1or 2 images) for each other pages with relevant compressed images. Main slider should have graphical images which display our main objectives

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නිළ වෙබ් අඩවියේ වෙබ් පිටු 38 ක් ඇතුළත් වේ .

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නිළ වෙබ් අඩවියේ සිතියම පහත සඳහන් පරිදි වේ.

[1] – [38] pages

| Home Page [1] | SLADA | Awareness on Doping | Social Engagements | Codes | Doping Control and Testing | Resources | Contact [38] |
|---|---|---|---|---|---|---|---|
| | [2] Board | [8] Prevention of Doping | [15] Anti-Doping Lectures | [20] Anti-Doping Agreements and codes | [24] Athlete must know<br>[25] Doping Samples | [30] Useful Links | |
| | [3] Organizational Structure | [9] Prohibited Drugs and Methods | [16] Exhibitions | [21] WADA Code | [26] Doping Test Result Management<br>[27] Anti-Doping Rule Violations | [31] Prohibited List 2019 | |
| | [4] SLADA Team | | | | | | |
| | [5] Committees and Panels | [10] TUE | [17] Research | [22] Sri Lanka Anti-Doping Code | [28] Doping Test Statistics<br>[29] Anti-Doping Terms | [32] WADA Code | |
| | [6] History and Annual Reports | [11] Whereabouts and ADAMS | [18] Events Calendar | [23] Legislation on doping | [24] Athlete must know<br>[25] Doping Samples | [33] International Standards on Anti-Doping | |
| | [7] Contact Us | [12] Doping Test Procedure | [19] Stakeholders | | [26] Doping Test Result Management<br>[27] Anti Doping Rule Violations | | |
| | | [13] Sanctions and Appeal Procedure | | | [28] Doping Test Statistics<br>[29] Anti-Doping Terms | [34] SLADA App | |
| | | [14] FAQ | | | | | |

# නෛතික විමර්ශන

**බී සාම්පලය විශ්ලේෂණය කිරීමේ විමර්ශනය**

2019 ජනවාරි 18 වන දින කාලිංග කුමාරගේ ක්‍රීඩකයාගේ බී සාම්පල් පරීක්ෂාව ඔහුගෙන් ලද අනුමැතිය මත (NDTL) හි සිදුකරන ලද අතර, එකී පරීක්ෂණය මගින් මූත්‍රා සාම්පලය තුළ තහනම් උත්තේජක අන්තර්ගත බව සනාථ වන ලදී.

කබඩි ක්‍රීඩක අයි.කේ. චාමර නුවන් සහ සජිනි මනෝරි ජයසිංහ යන අයගේ මූත්‍රා සාම්පලයන්හි තහනම් උත්තේජක ද්‍රව්‍ය අන්තර්ගත බව ඒ සාම්පල් පරීක්ෂාව මගින් තහවුරු වූ අතර, 2019 ජනවාරි මස 25 වන දින ක්‍රීඩකයන් දෙදෙනාම බී සාම්පල් පරීක්ෂාව සඳහා තම අකමැත්ත ප්‍රකාශ කරමින් ලිඛිත ලේඛනයක් සපයන ලදී. මලල ක්‍රීඩක චාමර මධුෂාන් සහ ඩබ්.එන්.එස්. කුමාර යන අයගේ බී සාම්පලය විශ්ලේෂණය කිරීම පිළිබඳ විමර්ශනය 2019 මැයි මස 16 වන දින පවත්වන ලද අතර එහිදී ක්‍රීඩකයන් දෙදෙනාම බී සාම්පල් පරීක්ෂාව සඳහා අකමැත්ත ප්‍රකාශ කරමින් ලිඛිත ලේඛනයක් ඉදිරිපත් කරන ලදී.

තවද පාපැදි ක්‍රීඩක සනත් ජයසිංහ සහ අශේන් දිල්ෂාන් යන අයගේ බී සාම්පලය විශ්ලේෂණය කිරීම පිළිබඳ පරීක්ෂාවද පිළිවෙලින් 2019 ජූලි මස 08 වන දින සහ 2019 අගෝස්තු මස 22 වන දින දී සිදු කරන ලද අතර, එහිදී ද ක්‍රීඩකයන් දෙදෙනාම බී සාම්පල් පරීක්ෂාවට තම අකමැත්ත ප්‍රකාශ කරමින් ලිඛිත ලේඛන ඉදිරිපත් කර ඇත.

මීට අමතරව රගර් ක්‍රීඩක තිළිණ විජේසිංහ සහ මල්ලවපොර ක්‍රීඩක ටී.කේ.ඩී. මධුහර්ෂ අය අයගේ බී සාම්පලය විශ්ලේෂණය කිරීම පිළිබඳ විමසීම් 2019 දෙසැම්බර් මස 24 දින සිදු කරන ලද අතර එහිදී ද ක්‍රීඩකයන් දෙදෙනාම බී සාම්පල් පරීක්ෂාවට තම අකමැත්ත ප්‍රකාශ කරමින් ලිඛිත ලේඛන ඉදිරිපත් කර ඇත.

# විනය පරීක්ෂණ

චාමර නුවන් සහ කබඩි ක්‍රීඩිකා සජිනි මනෝරි යන අයගේ විනය පරීක්ෂණය 2019 අප්‍රේල් මස 04 වන දින පැවැත්වුණි.කෙසේවෙතත් චාමර නුවන් යන අයට විනය පරීක්ෂණය සඳහා දැනුම් දීම් කිහිපයක් සිදු කළ ද ඔහුගේ සහභාගීත්වයක් සිදු නොවුණි.

මලල ක්‍රීඩිකා සී. මෙලනි බෙන්දරගේ යන අයගේ විනය පරීක්ෂණය

- 2019 මැයි 09
- 2019 ජුනි 06
- 2019 ජුනි 25
- 2019 ජූලි 02

යන දිනයන්හිදී පවත්වා නිම කළ අතර එයට අදාළ ලිඛිත දේශනය දෙපාර්ශවයේම නීතිඥවරයන් විසින් ගොනුකර ඇත. විනය පරීක්ෂණ තීන්දුව 2019 ඔක්තෝබර් මස 28 වන දින ලබා දෙන ලදී.

මලල ක්‍රීඩක කාලිංග කුමාරගේ යන අයගේ විනය පරීක්ෂණය අවසන් වරට 2019 ජූලි මස 30 වන දින කැඳවූ අතර එදින වාචික දේශන දෙපාර්ශවය විසින් සිදු කරන ලදී. 2019 අගොස්තු 30 වන දින ලිඛිත දේශනය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ගොනු කරන ලද අතර, ක්‍රීඩකයා වෙනුවෙන් ලිඛිත දේශනය 2019 සැප්තැම්බර් මස 4 වන දින ගොනු කරන ලදී. 2019 නොවැම්බර් මස විනය පරීක්ෂණ තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී.

බොක්සිං ක්‍රීඩක එච්.ඩබ්ලිව්.ඒ.සී. ඉන්දික පෙරේරා යන අයගේ විනය පරීක්ෂණය 2019 ජූනි මස 25 වන දින අවසන් කරන ලද අතර එහි අවසාන තීන්දුව 2019 සැප්තැම්බර් මස 16 වන දින විනය පරීක්ෂණ මණ්ඩලය විසින් ලබාදෙන ලදී.

## අභියාචනා පරීක්ෂණ

රගර් ක්‍රීඩක සුපුන් දිල්ෂාන් යන අයගේ අභියාචනා පරීක්ෂණය 2019 මාර්තු මස 13 වන දින පවත්වන ලදී. තවද රගර් ක්‍රීඩක ධනුෂ්ක පෙරේරා යන අයගේ අභියාචනා පරීක්ෂණය 2019 අප්‍රේල් මස 02 වන දින අවසන් කළ අතර, එහි අවසන් තීන්දුව ඉදිරි කාලයේදී ලබා දීමට නියමිතව ඇත.

මලල ක්‍රීඩක කාලිංග කුමාරගේ හා ක්‍රීඩිකා මෙලනි බෙන්දරගේ යන අයට ලබාදුන් තීන්දුවට එරෙහිව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අභියාචනා පෙත්සම් ගොනුකර ඇත.

බොක්සිං ක්‍රීඩක ඉන්දික පෙරේරා යන අය විසින් ගොනු කරන ලද අභියාචනා පෙත්සම ද අභියාචනා මූල මණ්ඩලය වෙත යොමුකර ඇත.

## තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව

2019 වර්ෂයට අදාළ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව අංක 2110/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය 11.02.2019 වන දින පළ කරන ලදී. ඉහත සඳහන් ගැසට් පත්‍රය සඳහා කැබිනට් අනුමැතිය ලබාගත් අතර 2019 අප්‍රේල් මස 03 වන දින පාර්ලිමේන්තු අනුමැතිය සඳහා යොමු කෙරේ.

පාර්ලිමේන්තු අනුමැතිය 2019 මැයි මස 21 වන දින ලැබිණි.

## විශේෂ අවස්ථා

1. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නව ගොඩනැගිලි පරිශ්‍රය 2019 පෙබරවාරි 28 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී. මෙම ගොඩනැගිල්ල සුගතදාස ක්‍රීඩාංගනයෙන් ලද ඉඩමේ Block D හි ස්ථාපිත කරන ලදී.

2. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සේවකයන් සඳහා ධම්මික මුතුගල මහතා විසින් කාර්යාල කළමනාකරණය පිළිබඳ වැඩසටහනක් පවත්වන ලදී.

3. ඔස්ට්‍රේලියානු උත්තේජක මර්දන අධිකාරිය (ASADA) හා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අතර ඇති කර ගන්නා වූ අවබෝධතා ගිවිසුමට අනුව ASADA සහ Australian Federal Police නියෝජනය කරමින් ලංකාවට පැමිණි නිලධාරීන් තිදෙනෙකු විසින් බුද්ධි අංශය සම විමර්ශනය පිළිබඳ වැඩසටහනක් පවත්වන ලදී.

## 2019 වර්ෂයේ වෙනත් විශේෂ අවස්ථා - විදේශීය

- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය සීවලී ජයවික්‍රම මහතා 2019 මාර්තු 12-14 දක්වා ස්විස්ටර්ලන්තයේදී පැවැති (INADO Workshop) WADA ADO Symposium" සඳහා සහභාගී විය.

- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ භාෂා පරිවර්තක වශයෙන් සේවය කරන කේ.ආර්. කණගසභාපති මෙනෙවිය 2019 මාර්තු 30 දින බංගලිදේශයේදී පැවැති (SARADO Education Officer Training) සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නියෝජනය කරමින් සහභාගී විය.

- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සභාපති වශයෙන් සේවය කරන මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා 2019.04.24 සිට 2019.04.26 දක්වා නේපාලයේ, කත්මණ්ඩු හිදී පැවැති SARADO අධ්‍යක්ෂ මණ්ඩල සමුළුව සඳහා සහභාගී විය.

- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය සීවලී ජයවික්‍රම මහතා 2019 ජූනි 27 සිට 28 දක්වා කොරියාවේදී පැවැති "2019 KADA Anti-Doping Seminar in Asia" වැඩසටහන සඳහා සහභාගී විය.

## බැහැරගත පුහුණු වැඩසටහන

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වාර්ෂිකව සංවිධානය කරනු ලබන කාර්ය මණ්ඩලයේ බැහැරගත පුහුණු වැඩසටහන 2019/08/10 වන දින හා 2019/08/11 වන දින යන දෙදින කිතුල්ගල Adventure Base Camp හි සාර්ථකව පවත්වන ලදී.

මෙහි දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලය සඳහා නායකත්ව පුහුණුව, රාජකාරී සඳහා අවශ්‍ය අභිප්‍රේරණය, ආකල්ප හා කණ්ඩායම් හැඟීම් ජනිත වන අයුරින් විවිධාකාර වූ ක්‍රීඩා ඉසව් ගණනාවක් පවත්වන ලද අතර Water Rafting හා දිය මත ක්‍රීඩා ඉසව් කිහිපයකින් ද සමන්විත විය. මේ සඳහා අප ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය සීවලී ජයවික්‍රම මහතා ද සහභාගී වූ අතර ඔහුගේ මඟපෙන්වීම තුළින් මෙම 2019 වාර්ෂික බැහැරගත පුහුණු වැඩසටහන තවත් අපූර්වත්වයක් ගැනුණි. මෙම වැඩසටහන සඳහා සහභාගී වූ කාර්ය මණ්ඩලය නවමු අත්දැකීම් හා ධනාත්මක ආකල්ප ළඟාකරගත් බව ඔවුන්ගේ අදහස් තුළින් පසක් විය.



During Leadership Program



During an event at the staff motivational development program



During Water Rafting event

## 2020 වර්ෂය සඳහා වන ඉලක්ක

- 2020 දකුණු ආසියාතික ක්‍රීඩා උළෙල සඳහා ශ්‍රී ලංකාව සත්කාරකත්වය දැරීමට බලාපොරොත්තු වන බැවින් එහි උත්තේජක පරීක්ෂණ කිහිපයක් සිදුකිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය බලාපොරොත්තු වේ.

- අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ පැවැත්වූ සාකච්ඡාවට අනුව ක්‍රීඩාවේදී තහනම් ද්‍රව්‍ය භාවිතය සහ එහි බලපෑම සම්බන්ධව කරුණු ශ්‍රී ලංකා පාසැල් විෂය මාලාවට එකතු කිරීමට පියවර ගත යුතුය.

- දිවයින පුරා ක්‍රීඩාවට සම්බන්ධ විවිධ කණ්ඩායම් ඉලක්කගත කර ගනිමින්, දීප ව්‍යාප්තව විශාල වශයෙන් තහනම් උත්තේජක පරීක්ෂණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කරයි.

- තහනම් උත්තේජක පාලන නිලධාරීන් වශයෙන් හසල දැනුමක් පවතින විදේශීය නිලධාරීන්ගේ සහය ඇතිව වසර 10 කට වැඩි ජාත්‍යන්තර පළපුරුද්දක් පවතින ශ්‍රී ලාංකික උත්තේජක පාලන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීමට බලාපොරොත්තු වේ.

- ආදර්ශ රෙගුලාසි මාලාව  ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නීතිඥ මනෝහර ජයසිංහ මහතා සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර හැකි ඉක්මනින් එම කෙටුම්පත පරීක්ෂා කිරීමට ඔහු එකඟත්වය පලකර සිටියේය. ශ්‍රී ලංකා උත්තේජක  මර්දන නියෝජ්‍යායතනයේ නීති නිළධාරි විසින් ශ්‍රී ලංකා නීතිය සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නීති සංග්‍රහය අතර ඇති පරස්පරතා පිළිබඳව පරීක්ෂා කරන ලෙස උපදෙස් දෙන ලදී.

- ඔස්ට්‍රේලියානු ක්‍රීඩා උත්තේජක මර්දන අධිකාරිය සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අතර ඇති වූ අවබෝධතා ගිවිසුමට අනුව ඔස්ට්‍රේලියානු ක්‍රීඩා උත්තේජක මර්දන අධිකාරියෙහි තොරතුරු තාක්ෂණය උසස් අන්දමින් භාවිතා කිරීම පිළිබඳව දැනුම උපයෝගී කර ගනිමින් අධිකාරියෙහි තොරතුරු තාක්ෂණ අංශය වැඩි දියුණු කිරීම.

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශය**

| ශේෂය | සටහන | 2019 දෙසැම්බර් 31 | 2018 දෙසැම්බර් 31 |
|---|---|---|---|
| වත්කම් | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | 208,530,974.49 | 5,412,026.32 |
| ප්‍රාග්ධන ප්‍රගතිය | 2 | 65,268,791.03 | 189,140,409.10 |
| | | **273,799,765.52** | **194,552,435.42** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 3 | 2,018,589.00 | 1,110,839.86 |
| අයවිය යුතු දෑ | 4 | - | - |
